# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 11 දරන

# අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරනු ලදී

---

1984 අප්‍රේල් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරනු ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 55 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 04 වන දින]

එල්. ඩී.—ඕ. 26/82

**අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පිහිටුවීම සඳහා ද ඒ මණ්ඩලයේ බලතල නිශ්චය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

2. (1) (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය ඖෂධ අයුතු ලෙස භාවිතා කරන්නන්ට අදාළව වැළැක්වීමේ, පාලනය කිරීමේ, ප්‍රතිකාර කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම භාර ප්‍රධාන ජාතික ආයතනය විය යුතු ය. *අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පිහිටුවීම.*

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් ව, මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සඳහා මණ්ඩලය වග කිව යුතු ය.

(3) මණ්ඩලය (1) වන උපවගන්තියෙන් ඊට පැවරී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම සංස්ථා නාමයෙන් නඩු පැවරීම ද, නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:— *මණ්ඩලයේ සංයුතිය.*

(අ) (මෙහි මින්මතු "පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු එක් සාමාජිකයකුගෙන් සහ වෙනත් සාමාජිකයන් දෙදෙනකුගෙන් ;

(ආ) පොලිස්පතිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

(ඇ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ; සහ

(ඈ) ආයුර්වේද කොමසාරිස්වරයාගෙන්.

(2) මණ්ඩලයෙහි, පත් කරන ලද සෑම සාමාජිකයකු ම, ඉල්ලා අස්වීම නිසා, මියයාම නිසා හෝ ඉවත් කරනු ලැබීම නිසා තම ධුරය කලින් හිස් කළහොත් මිස පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීම සඳහා ඔහු සුදුස්සකු විය යුතු ය.

(3) පත් කරන ලද සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියකින් දැනුම් දීමෙන් අස්විය හැකි ය.

2—ඒ 075784 — 6275 (84/03)

(4) පත් කරන ලද සාමාජිකයකු මිය ගියහොත් හෝ ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් මියගිය වූ, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවා වූ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු සාමාජිකයකු ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු මිය යාම නිසා, ඉල්ලා අස්වීම නිසා හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ස්වකීය ධුර කාලය ඉකුත් වීමට පෙර තම ධුරය හිස් කළහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(6) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකු රෝගාතුරවීම හෝ දුබලතාවක් හේතුවෙන් හෝ මාස තුනකට අඩු නොවන කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ බව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දන්වා සිටිම එම සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) ඉවත් කරනු ලැබීමෙන් හැර වෙනත් හේතුවකින් ස්වකීය ධුරය හිස් කළ මණ්ඩලයෙහි පත් කරන ලද යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ පත් කිරීමෙහි යම දෝෂයක් තිබීමේ හෝ හේතුව මත මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු නිර්බල යයි සලකනු නොලැබිය යුතු බව.

4. මණ්ඩලයේ සාමාජිකයන් අතර කිසියම් පුරප්පාඩුවක් තිබීම පමණක් හෝ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම පමණක් හෝ හේතුකොට ගෙන මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

5. අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන් වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

6. (1) මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන, මණ්ඩලයේ සභාපතිවරයා විසින් දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් ඒ රැස්වීමට පැමිණ සිටින මණ්ඩලයේ සාමාජිකයන් විසින් තමන් අතරින් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට එක් වරක් හෝ රැස්විය යුතු අතර, ඒ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් සකස් කර ගනු ලැබිය හැකි ය.

7. මණ්ඩලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:— මණ්ඩලයේ බලතල.

(අ) අන්තරායදායක ඖෂධ අයුතු ලෙස භාවිතා කිරීම් වැළැක්වීමට සහ පාලනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, ඒ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ ඒ ප්‍රතිපත්තිය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම ;

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන් ගෙන්, සංවිධානවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම :

එසේ වුවද මේ ඡේදයේ විධිවිධාන යටතේ ලබාගන්නා ලද යම් තොරතුරක් හෝ විස්තරයක් සාමාජිකයකු විසින් හෙළිදරව් කිරීම, අධිකරණයක් විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් අනුව කටයුතු කිරීම සඳහා වූ අවස්ථාවක හෝ මිස කරනු නොලැබිය යුතු ය ;

(ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග සහ ප්‍රදාන ලබා ගැනීම ;

(ඈ) අන්තරායදායක ඖෂධ වැළැක්වීමෙහි සහ පාලනයෙහි නිරත නියෝජිතායතනවල කටයුතු ඒකාබද්ධ කිරීම ;

(ඉ) ඖෂධවලට වහල් වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රියාමාර්ග නංවාලීම සහ ඖෂධ අයුතු ලෙස භාවිත කිරීම හා වැළැක්වීමේ ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙලවල් ළමයින් සහ වැඩිහිටියන් සඳහා පවත්වා ගෙන යාම ;

(ඊ) අන්තරායදායක ඖෂධ අයුතු ලෙස භාවිත කිරීමේ පැවැත්ම, හේතුසාධක සහ නීතිමය, වෛද්‍ය, සමාජ, සංස්කෘතික සහ ආර්ථික බලපෑම් පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයන භාර ගැනීම සහ පවත්වාගෙන යාම ; සහ

(උ) ඖෂධ පාලන කටයුතුවලට සම්බන්ධ ජාතික, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සහ නියෝජිතායතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම.

8. අමාත්‍යවරයා විසින් පවරනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම භාරකරනු ලැබිය යුතු ඒ අනුකාරක සභා මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය. අනුකාරක සභා පත් කිරීම.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

9. (1) මණ්ඩලයේ සභාපතිවරයා, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) මණ්ඩලය විසින් මේ පනතේ විධිවිධානවලට යටත් ව—

(අ) එහි බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ ඒ නිලධරයන් සහ සේවකයන් විෂයයෙහි විනය පාලනය කිරීම හෝ ඒ නිලධරයන් හා සේවකයන් සේවයෙන් පහ කිරීම;

(ආ) ඒ නිලධරයන්ට සහ සේවකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අනුප්‍රමාණ තීරණය කිරීම;

(ඇ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි තීරණය කිරීම; සහ

(ඈ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ වෙනුවෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රජයේ සේවයෙන් නිලධරයන් පත් කිරීම.

10. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

11. මණ්ඩලයෙහි සියලු නිලධරයන් සහ සේවකයන් ස්වකීය රාජකාරි කටයුතු භාර ගැනීමට පෙර සියලු කටයුතු සහ ලැබෙන්නා වූ සියලු තොරතුරු සහ ඊට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව තමා විසින් අනුගමනය කරන බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර— රහස්‍යතාව

(අ) (i) මණ්ඩලය විසින් ; හෝ

(ii) අධිකරණයක් විසින් ; හෝ

(iii) ඒ කාරණා අදාළ වන තැනැත්තා විසින් ; හෝ
හෙළිදරව් කරන ලෙස ඉල්ලා සිටි විට ;

(ආ) ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී ; හෝ

(ඇ) මේ පනතේ වෙනත් යම් විධිවිධාන හෝ වෙනත් යම් නීතියක් හෝ අනුව කටයුතු කිරීම සඳහා

හැර ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී, තමාට දැන ගන්නට ලැබෙන කිසිදු කරුණක් හෙළිදරව් නොකරන බවට එම ප්‍රකාශයෙන් පොරොන්දු විය යුතු ය.

12. (1) අරමුදලක් පිහිටුවා පවත්වා ගෙන යා යුතු අතර, ඒ අරමුදල, අමාත්‍යවරයා විසින් කලින් කල දෙනු ලබන විධාන අනුව පරිපාලනය කිරීම සහ පාලනය කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය. අරමුදල.

(2) අරමුදල වෙත—

(අ) මණ්ඩලයේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ආ) කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් මණ්ඩලය වෙත ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදලෙහි මුදල්—

(අ) අන්තරායදායක ඖෂධ අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වැඩපිළිවෙලවල් වලට මුදල් යෙදවීමේ කාර්යය සඳහා ;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම සඳහා සහ මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී මණ්ඩලය විසින් දරනු ලබන වෙනත් සියලු වියදම් පියවීම සඳහා

උපයෝගී කරගනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.